# ගුවන්විදුලිය මාධ්‍ය විවරණ



2.2344
AN

ආචාර්ය සේන නානායක්කාර

200|2
9952!

# ශ්‍රව්‍ය විද්‍යුත් මාධ්‍ය විවරණ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
## ආචාර්ය සේන නානායක්කාර
B.A. (Hons.), M.A. (Research), Ph.D. (Mass Comm.)
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ

RAJMNLIB
99521

ප්‍රවේශ අංකය 99521
වර්ග අංකය 302.2344 NAN

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

# පෙරවදන

ජනමාධ්‍ය සම්බන්ධයෙන් මෙතෙක් මා විසින් රචනා කරන ලද කෘතීන් ගණන දහය කි. එයින් බහුතරයකට ප්‍රස්තුත වන්නේ ගුවන්විදුලිය මාධ්‍යය යි. රූපවාහිනිය, චිත්‍රපටය හෝ ශ්‍රව්‍යදෘශ්‍ය මාධ්‍යයක් ගැන හෝ වඩාත් ජනප්‍රිය සාහිත්‍යමය මුද්‍රිත මාධ්‍යයක් ගැන හෝ නොලියා එසේ ගුවන්විදුලිය ම අළලා ලියන්නට මා පෙළඹෙන්නේ ඇයි ද යන්න ගැන මට ම තේරුම් ගත නොහැකි ය. කෙසේ වෙතත්, එක දෙයක් කිව යුතුව ඇත. මගේ ජීවිතයේ මාධ්‍ය තිඹිරිගෙය ත්, පුහුණු කඳවුර ත් දෙකම වූයේ ගුවන්විදුලිය බව යි.

එතෙක් ජීවිත කාලයට ම ගුවන්විදුලි මෛක්‍රෆෝනයකට වචනයක් හෝ කියන්නට, එසේ නැත්නම් ගුවන්විදුලි පිටපතක් ලෙස වචනයක් හෝ ලියන්නට වරම් නොලැබ සිටි මා හට එකී තිඹිරිගෙය වූයේ 1979 අප්‍රේල් 12 වෙනිදා මෙරට පිහිටුවා ලූ ප්‍රථම ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාව වූ රජරට සේවය යි.

එවකට වේදිකාව ඇතුළු වෙනත් මාධ්‍ය තුළ දහසක් දුෂ්කරතා හා දුක්තැවුල් මැද ශිල්ප හරඹ කළ මට ගුවන්විදුලි මැදිරිය වඩාත් සුවය දනවන සෞන්දර්යමය නවාතැන්පළක් වූ අයුරු හොඳින් මතක ය. පොතපත කියවා දින ගණන් වැය කොට දුක්මහන්සි වී ගුවන්විදුලි විචිත්‍රාංගයක් හෝ නාට්‍ය පිටපතක් රචනා කොට අවසන, සීතල මැදිරිය තුළ එය පටිගත කිරීමෙන් ලද අස්වැසිල්ල වඩාත් ආස්වාදජනක ය. ගෙදරදී හෝ පාසලේදී පමණක් නොවේ, ගමේ-ගොඩේ නගරයේ මගතොට සැරිසරන අතරතුර මගේම කටහඬ ගුවනින් ඇසෙද්දී එවක මා ලද සතුට අප්‍රමාණ ය. පෙරදා රාත්‍රියේ අසන්නන් කන්දුන් නාට්‍යයට පසුදා උදෑසනින් ම ප්‍රතිචාර ලබන්නට තරම් අපේ ශිල්පීහු වාසනාවන්ත වූ හ. හැමෙකෙක් ම අප ශ්‍රාවකයෝ

වෙති. එවක රජරට සේවාව ලද ප්‍රතිචාර එබඳු ය. රජරට සේවයෙන් කලාකාර භූමිකාවට අත්පොත් තැබූ නාට්‍ය ශිල්පීන්, පිටපත් රචකයින්, ගායක ගායිකාවන්, කවීන් කිවිඳියන්, නිවේදක නිවේදිකාවන්, සංගීතවේදීන් අපමණ ය. එකී දිගු නාමාවලිය මෙහි සඳහන් නොකරනුයේ හුදෙක් මේ පෙරවදනෙහි ලුහුඬු බව රැකගනු පිණිසම ය. අද ඔවුහු කලාවේ නව ඉසව් සොයමින්, පිරික්සමින් රටට මග කියන කලාකරුවෝ බවට පත්ව සිටිති. එවක රජරට සේවය එබඳු පිං බිමක් ව පැවතුණු අයුරු දිවි ඇති තුරාවට අප දෑස අබියස ජීවමාන වෙයි. නමුත්, එදා සහසක් දුහුනන් හට තිසි මං පෙන්වා දුන් ඒ උතුම් සරස්වතිය අද සිය දෑත රැඳි වීණාව ත්, පුස්තකය ත් අතහැර දමා ඇති අයුරු අතිශය ඛේදජනක ය.

ඒ කෙසේ වුව, ගුවන්විදුලිය මාධ්‍යය අප අමතක නොකළ යුත්ත කි. නමුත්, දහසකුත් රූපමාධ්‍ය තුළ විසූක දස්සන බහුල වූ සමයක ඊට වශීකෘත වූ අය දෑස් දල්වා එදෙස බලා සිටින විට පරණ රේඩියෝව කුස්සියට වැදී ඇති බවක් සමහරු කියති.

එහෙත්, එකී මාධ්‍ය පිළිබඳ යථාවබෝධය සාමාන්‍ය ජනතාව තුළ පතළ කරවීමෙන් ඉහත සඳහන් අයහපත් ප්‍රවණතාව සුභදායක තත්ත්වයක් කරා නැවත හරවාලිය හැකි ය. ඒ සඳහා කළ යුත්ත වන්නේ මේ මාධ්‍ය පිළිබඳ සංවාදශීලී සාහිත්‍යයක් වර්ධනය කරවීම යි. "ගුවන්විදුලිය-මාධ්‍ය විවරණ" කෘතිය මා අතින් සම්පාදනය කෙරෙනුයේ එකී ඌන පූරණය උදෙසා ය.

මේ සඳහා මා මෙහෙයවූ රාජ්‍ය සම්මානලාභී දේශබන්දු සිරිසුමන ගොඩගේ සුධීමතුන්ට ත්, "ලක්බිම" පුවත්පතේ කර්තෘ මාණ්ඩලික ප්‍රවීණ ලේඛක මහින්ද දළුගොඩආරච්චි සහෘදයාට ත් මගේ ගෞරව පූර්වක ප්‍රණාමය පිරිනමමි.

සේන නානායක්කාර

**පෙරමග**


| | පිටුව |
|---|---|
| පෙර පඬුර | 05 |
| පෙරවදන | 07 |
| පෙරමග | 09 |
| ලංකා ගුවන්විදුලියේ මුල්කාලීන අරමුණු සහ එහි යටත්විජිත ක්‍රියාකාරිත්වය | 11 |
| ප්‍රාදේශීයසේවා සංකල්පය සහ එහි පසුකාලීන ස්වරූපය | 22 |
| ගුවන්විදුලිය මාධ්‍ය හා සංවර්ධන සන්නිවේදනය | 34 |
| ශ්‍රවණ පර්යේෂණ ක්‍රියාවලිය සහ එහි සමාජ සන්නිවේදනාත්මක වැදගත්කම | 46 |
| සිංහල ගුවන්විදුලි නාට්‍යයේ අතීත අප්‍රකට තොරතුරු | 63 |
| ශ්‍රී ලංකා ගුවන්විදුලියේ රජරටසේවාව සහ සංවර්ධනාත්මක කාර්යභාරය | 81 |
| රන්ගිරි ශ්‍රී ලංකා පස්වසරක මාධ්‍ය මෙහෙවර | 105 |